# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
# (කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**01. <u>සමාජ ආරක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ) – 01</u>**

**A. බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: ( පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
   සහ
   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

5. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
   සහ
   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**B. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA 2) සේවා ගණයේ II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

**වයස් සීමාව - :** අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -:** 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් ප්‍රමාණය JM 1-1 2016 - රු. 42,000.00 – 10x755 – 18x1,135 – 70,580.00 ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය -:** රු. 42,600.00 වේ.
**වෙනත් දීමනා -:** රජය මගින් අනුමත දීමනා හා පහසුකම් හිමි වේ.

මෙම තනතුරු ස්ථිර ය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමි වේ. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුර සඳහා බඳවාගනු ලැබේ. ඔබගේ අයදුම්පත්‍රය හා අදාළ සහතිකපත් **"සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය"**යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත 2024.05.20 දිනට පෙර ගෙනවිත් බාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුයි. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. අයදුම්පත්‍රය www.ssb.gov.lk වෙබ් අඩවිය තුළින් ලබාගත හැක.

**සභාපති,**
**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස",**
**අංක 18, රාජගිරිය පාර,**
**රාජගිරිය.**
**2024.05.07**